**විෂය - පෙරදිග සංගීතය**

02 වාරය

13 ශ්‍රේණිය

Prepared by : Mrs.H.A.U.W.Dharmadasa

**නිපුණතාවය 1.0 / නිපුණතා මට්ටම 1.1** **I කොටස** **පාඩම : රාගය භෛරව්**

**ප්‍රශ්න අංක 01 සිට 04 දක්වා වඩාත් නිවැරදි වරණය තෝරන්න.**

01.භෛරව් රාගය,
1.උත්තරාංග ප්‍රධාන රාගයකි. 2.පරමේල ප්‍රවේශක රාගයකි 3.චංචල ප්‍රකෘති රාගයකි
4.පූර්වාංග ප්‍රධාන රාගයකි. 5.සංක්ෂිප්ත රාගයකි

02.භෛරව් රාගයේ ආන්දෝලිතව යෙදෙන ස්වර යුගලය ,
1.රි,ප 2.ග,නි 3.ම,<u>ධ</u> 4.ස,ප 5.<u>රි</u>,<u>ධ</u>

03. භෛරව් රාගය,
1.ෂාඩව ජාති රාගයකි 2.සම්පූර්ණ ජාති රාගයකි 3.ඖඩව - සම්පූර්ණ ජාති රාගයකි
4.ෂාඩව සම්පූර්ණ ජාති රාගයකි 5.ඖඩව ජාති රාගයකි

04.භෛරව් රාගයෙහි ජීවය රදා පවතින්න ස්වරය නම්,
1.කෝමල රිෂභය 2.පංචමය 3.ගාන්ධාරය 4.සඞ්ජය 5.කෝමල ධෛවතය

**ප්‍රශ්න අංක 05 සිට 10 දක්වා හිස්තැන් වලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

**(පුරුෂ,රාම්කලි, උච්ච, රිෂභය, ගාම්භීර, මන්ද්‍ර, භෛරව්, ප්‍රථම, ධෛවතය, චංචල, දෙවන )**

05.භෛරව් රාගයේ ආරෝහණයේ ........................... දුර්වලව යෙදේ.

06. ............................ රාගය භෛරව් රාගයට සමීප ලක්ෂණ සහිත රාගයකි.

07.භෛරව් රාගය ............................. ප්‍රකෘති රාගයකි.

08. භෛරව් රාගය ............................. රාගයකි.

09.රාග-රාගිනී වර්ගීකරණයට අනුව භෛරව රාගය ලෝකයේ .................... රාගය ලෙස සැලකේ.

10. භෛරව් රාගය ............... හා මධ්‍ය සප්තක වල බහුලව විස්තාර වේ.

**නිපුණතාවය 1.0 / නිපුණතා මට්ටම 1.2** **II කොටස** **පාඩම : රාගය හංසධ්වනි**

**සියලුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.**

01) I. භෛරව් රාගය පිළිබද විස්තරාත්මකව හදුන්වන්න.
II. භෛරව් රාගයේ මධ්‍යලය ඛියාල් ගීතයක් ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.